

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2021

මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ආයතනයේ නම : මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංකය 440

අන්තර්ගතය

පරිච්ඡේදය	විස්තරය	පිටු අංකය
පරිච්ඡේදය 01	ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	01
පරිච්ඡේදය 02	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	05
පරිච්ඡේදය 03	වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	11
පරිච්ඡේදය 04	කාර්යසාධන දර්ශක	19
පරිච්ඡේදය 05	තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	20
පරිච්ඡේදය 06	මානව සම්පත් පැතිකඩ	21
පරිච්ඡේදය 07	අනුකූලතා වාර්තාව	23

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ප්‍රෞඩ ඉතිහාසයකට හිමිකම් කියන අප රටේ මැණික් කර්මාන්තය ලෝකයේ අගනා හා දුර්ලභ මැණික් වලින් පරිපූර්ණ රටක් ලෙස ප්‍රසිද්ධියට පත් වී ඇත. එසේම ලංකාවේ ස්වර්ණාභරණ කර්මාන්තය ද අතීතයේ සිට සම්ප්‍රදායික උරුමයන් රැක ගනිමින් දිනෙන් දින සංවර්ධනය වන කර්මාන්තයකි. ඒ අනුව, ශ්‍රී ලංකාව මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ තරඟකාරී ජාත්‍යන්තර මධ්‍යස්ථානය බවට පත් කිරීම උදෙසා අප කැප වී සිටිමු.

අතිගරු ජනාධිපතිතුමන්ගේ **"රට හඳන සෞභාග්‍යයේ දැක්ම"** ජාතික ප්‍රතිපත්තිය අනුව යමින්, අප රට සතු මැණික් සම්පත, පරිසරයද උපරිම ආරක්ෂා කරගනිමින් නවීන තාක්ෂණය ද මුසු කරගනිමින් සුරක්ෂිතව ගොඩගෙන පුද්ගලික අංශය ද එක්කර ගනිමින් අගය වැඩිකිරීමේ ක්‍රමවේදයන් අනුගමනය කරමින් මෙන්ම ස්වර්ණාභරණ කර්මාන්තය ද ප්‍රවර්ධන කරමින් මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ තිරසර සංවර්ධනය වෙනුවෙන් අප අමාත්‍යාංශය පෙරමුණ ගෙන සිටී.

ගෝලීය කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අනෙකුත් සෑම ක්ෂේත්‍රයකටම මෙන්ම මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත ක්ෂේත්‍රයටත් 2021 වසර සඳහා සැලසුම් කළ ඉලක්ක අත්පත් කරගැනීම අභියෝගාත්මක විය. වසංගත තත්ත්වය හේතුකොට ගෙන ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම් වල ඇතිවූ මන්දගාමී ස්වභාවය මෙම ක්ෂේත්‍රය කෙරෙහිද දැඩි බලපෑමක් ඇති කරන ලදි.

එවැනි අභියෝගාත්මක තත්ත්වයක් තුළ 2020 වසරට සාපේක්ෂව 2021 වර්ෂයේ මැණික් හා ස්වර්ණාභරණ අපනයනය ඇ.ඩො.මි. 264 දක්වා ඉහල අගයක් වාර්තා කිරීමට හැකිවීම සුවිශේෂී ජයග්‍රහණයකි. එය 2020 වර්ෂයේ සමස්ත මැණික් හා ස්වර්ණාභරණ අපනයන වටිනාකම වූ ඇ.ඩො.මි 170 සමඟ සංසන්දනය කරන විට 55% ක වර්ධනයකි. එම වර්ධනය අත්පත් කර ගැනීම සඳහා මාර්ගගතව අපනයනය කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම, අපනයන සේවා ගාස්තු සඳහා සහන සලසා දීම, බදු සහන ලබාදීම ඇතුළුව කර්මාන්තයේ ව්‍යාපාරිකයන් සඳහා අවශ්‍ය දිරිගැන්වීම් හා සහයෝගය ලබාදීම පිණිස අදාළ අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණය වෙමින් කටයුතු කරන ලදි.

මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ විදේශ ශ්‍රම වෙළඳපොල අවශ්‍යතාවන් ද සැපිරෙන ලෙස වෘත්තීය නිපුණතාවය ඉහළ නැංවීම සඳහා නව පර්යේෂණ පුහුණු වැඩසටහන් හඳුන්වා දීමටත්, දැනට පවත්වනු ලබන වැඩසටහන් වල ගුණාත්මකභාවය ඉහළ නැංවීමත් සඳහා සබරගමු විශ්වවිද්‍යාලය සහ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ එක්ව කටයුතු කිරීමට හැකිවීමද මෙම වර්ෂයේදී අත්කරගත් සුවිශේෂී ජයග්‍රහණ වේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර

දැක්ම

"ශ්‍රී ලංකාව මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ තරඟකාරී ජාත්‍යන්තර මධ්‍යස්ථානයක් බවට පත්කිරීම."

මෙහෙවර

"මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්ත විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, මග පෙන්වීම තුළින් දේශීය කර්මාන්ත නගා සිටුවීම සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම."

1.3 ප්‍රධාන කාර්යයන්

- **"රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය**

ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංවර්ධන උපාය මාර්ගය වන **"රට හදන සෞභාග්‍යයේ දැක්ම"** ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් බිහි කිරීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය තුළින් ඉටුකළ යුතු පහත සඳහන් කාර්යයන් දක්වා ඇත.

- මැණික් වැනි දැනට හඳුනාගෙන ඇති වටිනාකම එකතු කිරීමෙන් තොරව අපනයනය කරන ඛනිජ සම්පත් එසේ අපනයනය කිරීම සීමා කොට වටිනාකම් එකතු කළ ඉහළ අපනයන ආදායමක් ලබා ගත හැකි නිෂ්පාදන බවට පත්කර අපනයනය කිරීම.
- කපා ඔපදමන මැණික් අපනයනය වෙනුවට නිම කරන ලද ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය නූතන අධිතාක්ෂණික උපකරණ, ආනයන බදුවලින් නිදහස් කිරීම.
- දැනට භූගතව හා සාගර අභ්‍යන්තරයේ ඇතැයි සැළකෙන ඛනිජ සම්පත් නූතන අධිතාක්ෂණය භාවිතයෙන් ගවේෂණය කර රටේ නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට යොදා ගැනීම.

- **අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යයන්**
  - මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම
  - ජාතික අයවැය හා ආයෝජන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
  - අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යවස්ථාපිත ආයතනයන් වන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය හා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය යන විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

- **සුවිශේෂී ප්‍රමුඛතා**
  - පුද්ගලික අංශය සමඟ තරඟකාරී මට්ටමින් මැණික් ආශ්‍රිත කර්මාන්ත නිර්මාණශීලී ප්‍රවේශයක් හරහා නව්‍යකරණයට ලක් කිරීම.
  - වටිනාකම එකතු කිරීමෙන් තොරව අපනයනය කරන මැණික් අපනයනය සීමා කොට ඒ ආශ්‍රිත කර්මාන්තයන් සඳහා වටිනාකම, එකතු කළ ඉහළ අපනයන ආදායමක් ලබා ගත හැකි අපනයන නිෂ්පාදන බවට පත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
  - කපා ඔපදමන මැණික් අපනයනය වෙනුවට නිමකරන ලද ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම සඳහා නූතන අධි තාක්ෂණික උපකරණ ආනයනය බදුවලින් නිදහස් කිරීම.
  - මැණික් හා ඛනිජ සම්පත් කර්මාන්ත ආශ්‍රිතව ලබා ගතයුතු පරිසර හා අනෙකුත් අවසර පත්‍ර ක්‍රියාවලිය සමාලෝචනයට ලක් කොට සරල කිරීම හා කර්මාන්තකරුවන් වෙත එම සේවා සැපයීම් පහසු කරලීම.

සංවිධාන ව්‍යූහය - 2021

මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය



1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු / දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ / දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

නැත

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

1. ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
2. මැණික් සහ ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

නැත

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 2021 වර්ෂයේ ප්‍රගතිය

ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංවර්ධන උපාය මාර්ගය වන **"රට හඳන සෞභාග්‍යයේ දැක්ම"** ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් බිහි කිරීමේ අරමුණ හා මෙම අමාත්‍යාංශය වෙත ලබා දෙන ලද සුවිශේෂී ප්‍රමුඛතාවන් සාක්ෂාත් කර ගැනීම සඳහා මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ සංවර්ධනය උදෙසා පහත සඳහන් කාර්යයන් ඉටු කර ඇත.

01	බලපත්‍ර ලබා දීමේ ක්‍රමවේදය සරල කිරීම හා එක් වහලක් යටින් සේවා ලබා දීම (One - Stop - Shop).	• මේ යටතේ පරිසර අධිකාරිය, මහවැලි අධිකාරිය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වැනි ආයතන වලින් ලබාගත යුතු අනුමැතිය ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය විසින් ලබා ගෙන මසක් ඇතුලත බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කර ඇත.
02	කුඹුරු ඉඩම් වල පතල් කැණීම සඳහා තිබූ සීමාවන් ලිහිල් කිරීම හා ගාස්තු අඩු කිරීමට කටයුතු කිරීම.	• වරකදී පර්චස් 20 කට පමණක් ලබා දී තිබූ අනුමැතිය පර්චස් 40 දක්වා වැඩි කිරීම. • පර්චස් 20 ට වැඩි වන සෑම පර්චසයක් සඳහාම අය කරන ලද රු. 1,000.00 ක ගාස්තුව රු. 250.00 දක්වා අඩු කිරීම. • ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය මඟින් අයකල තැන්පතු ගාස්තුවට අමතරව ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මඟින් අය කරන ලද තැන්පතු ගාස්තුව ඉවත් කිරීමට කටයුතු කිරීම (යාන්ත්‍රික පතල් සඳහා රු. 250,000.00 ක් හා යාන්ත්‍රික නොවන පතල් සඳහා රු. 5,500.00 ක් වශයෙන්).
03	රත්නපුර ජාත්‍යන්තර මැණික් සහ ස්වර්ණාභරණ මධ්‍යස්ථානය ඉදි කිරීම (මැණික් කුළුණ).	• ශ්‍රී ලංකාවේ මැණික් කේන්ද්‍රස්ථානය වශයෙන් සලකන රත්නපුර දිස්ත්‍රික් ජනතාව වසර 25 කට අධික කාලයක් තිස්සේ බලාපොරොත්තු වූ මැණික් කුළුණේ පලමු අදියරේ ඉදි කිරීම් 2021 වසරේ ජනවාරි මසදී ආරම්භ කෙරිනි. • මෙහි පිරිවැය රුපියල් මිලියන 365 වන අතර මහල් පහකින් සමන්විත වේ. 2022 වර්ෂයේ ජුනි මස වැඩ අවසන් වීමට නියමිතය. • දෙවන අදියර සඳහා ඇස්තමේන්තුගත වියදම රුපියල් බිලියන 6 ක් වන අතර මහල් 14 කින් සමන්විත වේ. ලබන වසරේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නියමිතය. 2025 වසරේදී වැඩ නිම කිරීමට අපේක්ෂිතය.
04	මැණික් හා ස්වර්ණාභරණ අපනයනයට අදාළ ඉපැයීම් ආදායම් බද්දෙන් නිදහස් කිරීම.	• 14% ලෙස පැවති මෙම ක්ෂේත්‍රය සඳහා වූ ආදායම් බද්ද 2021.04.01 දින සිට ඉවත් කිරීමට කටයුතු කර ඇත.

05	කොවිඩ් - 19 වසංගත තත්ත්වයට සාර්ථකව මුහුණ දීම සඳහා මැණික් හා ස්වර්ණාභරණ අපනයනකරුවන්ට පහසුකම් සැලසීම.	• මේ යටතේ ඇ.ඩො. 3,000.00 දක්වා මාර්ගගත අලෙවි කිරීම් (Online Trading) පහසුකම් සැලසීම සහ අපනයනයේදී වටිනාකම මත අයකල සේවා ගාස්තුව 0.5% සිට 0.25% දක්වා අඩු කිරීම. අන්තර්ජාලය මඟින් සිදු කරන අපනයනයන් තවදුරටත් සංවර්ධනය කිරීමට හැකිවන පරිදි මෙම පහසුකම් තවදුරටත් පුළුල් කිරීමට කටයුතු කරමින් පවති.
06	අප්‍රිකානු රටවල් වලින් රළු මැණික් ලංකාවට ගෙන ඒමට පහසුව සැලසෙන පරිදි මැණික් ව්‍යාපාරිකයින්ට සෘජු ගුවන් ගමන් පහසුකම් ඇති කිරීමට කටයුතු කිරීම.	• මේ සඳහා ශ්‍රී ලංකන් ගුවන් සමාගම සමඟ සාකච්ඡා කර සීෂෙල්ස් සිට නයිරෝබි දක්වා සතියකට ගුවන් වාර 2ක් පවත්වා ගෙන යාමට කටයුතු කරන ලදි.
07	තායි "බාත්" මුදල් ඒකකය ලංකාවේ පිලිගත් විදේශීය ව්‍යවහාර මුදල් ඒකකයක් වශයෙන් නම් කරවා ගැනීමට කටයුතු කිරීම.	• තායි බාත් මුදල් ඒකකය වෙනත් මුදල් ඒකක වලට පරිවර්තනය කර ශ්‍රී ලංකාවට ගෙන ඒමට සිදු වීමෙන් ව්‍යාපාරිකයින් හා ගනුදෙනුකරුවන් මුහුණ දුන් ගැටළුව මෙමඟින් විසඳීමට හැකි වේ. එබැවින්, ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සාකච්ඡා කර තායි බාත් මුදල් ඒකකය ශ්‍රී ලංකාවේ පිළිගත් ව්‍යවහාරික මුදල් ඒකකයක් බවට පත් කරවා ගැනීමට කටයුතු කර ඇත.
08	මැණික් හා ස්වර්ණාභරණ ශිල්පීන් සඳහා සහනදායී ක්‍රමවේදය යටත් රුපියල් මිලියන 10 ක් දක්වා ණය ලබා දීම සඳහා ලංකා බැංකුව සමඟ එකඟ වී ඇත.	• දිවයින පුරා සිටින පාරම්පරික ස්වර්ණාභරණ ශිල්පීන් මේ වන විට 10,000 කට අධික ප්‍රමාණයක් ලියාපදිංචි වී ඇත.
09	අලෙවි පහසුකම් ප්‍රවර්ධනය	
I	කොළඹ රන් වෙළඳ මධ්‍යස්ථානය (Colombo Gold Center)	• නාගරික සංවර්ධන අධිකාරිය සමඟ එක්ව කොළඹ රන් වෙළඳ මධ්‍යස්ථානය (Colombo Gold Center) ප්‍රවර්ධනය කිරීමට අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට කටයුතු කරමින් පවති. ඒ යටතේ ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය මඟින් සහනික කරන ලද ස්වර්ණාභරණ අලෙවි කිරීමට පහසුකම් සැලසීම තුළින් මිලදී ගන්නන් තුළ විශ්වාසය ඇති කිරීමට කටයුතු කෙරේ.
II	2022 ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ අලෙවි හා වෙළඳ ප්‍රදර්ශනයක් වාර්ෂිකව පැවැත්වීම.	• ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ අලෙවි හා වෙළඳ ප්‍රදර්ශනයන් 2022 වසරේ පැවැත්වීමට කටයුතු කෙරේ.
III	කුඩා පරිමාණ ස්වර්ණාභරණ ශිල්පීන්ට අලෙවි පහසුකම් ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය මඟින් සැලසීමට කටයුතු කෙරේ.	• සුදුසු ස්ථාන හඳුනාගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය හා මහවැලි අධිකාරිය සමඟ සාකච්ඡා කර ඇත.
IV	මැණික් හා ස්වර්ණාභරණ නිෂ්පාදන ගම්මාන වැඩි දියුණු කිරීම.	• මේ යටතේ ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය හා සමෘද්ධි අධිකාරිය එක්ව නිෂ්පාදන ගම්මාන වල ශිල්පීන්ට අවශ්‍ය මූල්‍ය පහසුකම්, නිෂ්පාදනයට අදාළ නව තාක්ෂණික දැනුම

හා ශිල්පීය කුසලතා වර්ධනය කර ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීම සහ අන්තර්ජාලය හරහා තම නිෂ්පාදන අලෙවි කිරීමට අවශ්‍ය දැනුම ලබා දීම මඟින් නිෂ්පාදන ගම්මාන ආශ්‍රිතව සංචාරක ආකර්ෂණය වැඩි දියුණු කර ගැනීමට අපේක්ෂා කෙරේ. මේ වන විට ගාල්ල, හම්බන්තොට සහ ඇහැලියගොඩ ප්‍රදේශ වල ගම්මාන තෝරා ගෙන සංවර්ධනය කිරීම සඳහා මූලික කටයුතු සිදු කෙරෙමින් පවති.

V	මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයට අදාළව Coffee Table Books හඳුන්වා දීමට කටයුතු කිරීම.	• මේ යටතේ ස්වර්ණාභරණ ශිල්පීන්ගේ නිර්මාණ ඇතුලත් Coffee Table Book එකක් සහ මැණික් කර්මාන්තයේ ඓතිහාසික තොරතුරු සමඟ සංචාරක ආකර්ෂණයක් ඇතිවන අයුරින් මැණික් සඳහා Coffee Table Book එකක් නිර්මාණය කිරීමට අදාල මූලික කටයුතු සිදු කර ඇත.
VI	සුළු හා මධ්‍ය පරිමාණ මැණික් හා ස්වර්ණාභරණ ශිල්පීන් සඳහා අන්තර්ජාලය මඟින් අලෙවි පහසුකම් ලබා දීමට හැකි පරිදි නව වෙබ් අඩවියක් අධිකාරිය විසින් නිර්මාණය කිරීම.	• විදේශීය වෙළඳපළ සමඟ සම්බන්ධතා ඇති කිරීම හා නව ව්‍යාපාරික අවස්ථා උදා කර ගැනීමට අවශ්‍ය පහසුකම් මෙමඟින් සලසා දෙනු ලබයි. මෙම වෙබ් අඩවිය නිර්මාණ කිරීමේ කටයුතු අවසන් අදියරේ සිදු වෙමින් පවතී.
VII	විදේශීය වෙළඳපළ සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම.	• නේපාලයේ මැණික් නිධි ගවේෂණයට අදාළව තාක්ෂණික සහයෝගය ලබා දීම සඳහා එරට රජය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට කටයුතු කරමින් පවතී. එම රටෙහි රළු මැණික් ආනයනය සඳහා අවස්ථාව උදාකර ගැනීමටද අපේක්ෂා කෙරේ. • කොරියාවේ ව්‍යාපාරික අවස්ථා සපයා ගැනීමට කොරියානු මැණික් වෙළඳ සංගමය හා ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ සංගමය සමඟ සාකච්ඡා කර ඇත. • අප්‍රිකානු රට වලින් රළු මැණික් ආනයනය කිරීම හා මැණික් ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික දැනුම ලබා දීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරමින් පවතී. • අනෙකුත් රටවල් සම්බන්ධයෙන් ව්‍යාපාරික අවස්ථා හා තාක්ෂණික දැනුම හුවමාරු කර ගැනීමට හා ලබා ගත හැකි ඉඩ ප්‍රස්ථාවන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තානාපතිවරු සමඟ සාකච්ඡා කිරීමට කටයුතු කර ඇත.
VIII	ස්වර්ණාභරණ මෙන්ම රළු හා කපා ඔපමට්ටම් කරන ලද මැණික් උකස් කර අවශ්‍ය ණය පහසුකම් ලබා ගැනීමට හැකි	• මහජන බැංකුව විසින් යෝජනා කර ඇති ක්‍රමවේදය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. 2022

වන පරිදි ක්‍රමවේදයක් හඳුන්වා දීම සඳහා රජයේ වාණිජ බැංකු සමඟ කටයුතු කිරීම.

වසරේ මුල් කාර්තුව තුල අදාළ යෝජනා ක්‍රමය ක්‍රියාවට නැංවීමට අපේක්ෂා කෙරේ.

10. මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නියුතු වූවන්ගේ වෘත්තිමය තත්ත්වය ඉහල නැංවීම

I ජාත්‍යන්තරව පිළිගත් වෘත්තිමය සහතිකයක් ලබා ගත හැකි වන පරිදි පාඨමාලා සංවර්ධනය කිරීම හා නව පාඨමාලා හඳුන්වා දීම.

- මැණික් සම්බන්ධයෙන් වන සහතික පත්‍ර හා ඩිප්ලෝමා පාඨමාලා සහ රසායනාගාර පහසුකම් සඳහා මේ වන විට ප්‍රසිද්ධියට පත්ව ඇති, බ්‍රිතාන්‍ය, ජර්මනිය, ස්විස්ටර්ලන්තය වැනි රටවල් මැණික් හමුනොවන රටවල් වේ (Non – Gem Bearing Countries). වසර 3000 ක් පමණ අතීතයක් ඇති අපරටේ මැණික් කර්මාන්තයට අදාළ ජාත්‍යන්තර මට්ටමේ පිලිගැනෙන පාඨමාලා නොමැති වීම මෙම කර්මාන්තයේ අභිවෘද්ධිය සඳහා විශාල අඩුවකි. එබැවින්, මේ සඳහා සබරගමුව විශ්ව විද්‍යාලය සමඟ ඒකාබද්ධව නව පාඨමාලා හඳුන්වා දීමට කටයුතු කරමින් පවතී. මේ සඳහා, වන අවබෝධතා ගිවිසුම 2021.11.11 දින අත්සන් තබන ලදී. අදාල පාඨමාලා 2022 වසරේ දෙවන කාර්තුව තුළ ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

- කාර්මික විද්‍යාල හා තාක්ෂණික විද්‍යාල වල මැණික් හා ස්වර්ණාභරණ පාඨමාලා පැවැත්වීමට අදාල අවබෝධතා ගිවිසුම කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව සහ මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ සහ පුහුණු ආයතනය අතර 2022.01.06 දින අත්සන් කර ඇත.

- මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලා සඳහා ජාතික වාත්තීය සුදුසුකම් ලබා ගැනීමට අදාලව කර්මාන්තයේ විද්වතුන් සහ තෘතීයික හා වාත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කර ඇති අතර විෂයමාලා සකස් කිරීම සහ පාඨමාලා ප්‍රතීතනය කිරීමට අදාල කටයුතු සිදු කරමින් පවතී.

II මැණික් නිධි ගවේෂණය.

I මැණික් නිධි සිතියම් ගත කිරීම.

- මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය 2008 වසරේ සිට ගවේෂණය කර සිතියම්ගත කරන ලද මැණික් විහව ස්ථානයන්හි ඉඩම් හිමියන්ට පතල් කැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරදීමට අදාලව පර්යේෂණ පතල් කැණීම් සිදු කිරීමට සැලසුම් කර ඇත.

II ගවේෂණය සඳහා වන මැණික් පතල් කැණීම් ක්‍රමවේදයක් සලසා දීම.

- මැණික් ඉල්ලම් තිබේද, නොතිබේද යන්න නිශ්චිතව හඳුනාගෙන නොමැති ප්‍රදේශවල පතල් කැණීම් බලපත්‍ර සඳහා යම් සහනයක් සලසා දෙන ලෙස ග්‍රාමීය නිෂ්පාදන

		කර්මාන්ත වැඩිදියුණු කිරීමේ සංවර්ධන කමිටු රැස්වීම් වලදී ඒ ඒ ප්‍රදේශවල ජනතාවගෙන් ඉල්ලීම් රාශියක් ලැබිනි. ඒ අනුව, මැණික් ගවේෂණය සඳහා සහන ගාස්තු ක්‍රමය යටතේ නිශ්චිත කාලයකට අවසර ලබා දීමට (Test Mining Permit) ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කරමින් පවතී.
		• මැණික් පතල් කර්මාන්තය ජාත්‍යන්තරයට යොමු කිරීමට හා කර්මාන්ත කරුවන්ගේ සුරක්ෂිතතාවය සහතික කිරීමට නව ආරක්ෂණ ක්‍රමවේදය හඳුන්වා දීම.- ආරක්ෂණ අත්පොත එළි දක්වා ඇත.
12.	ආයතනික සංවර්ධනය හා සේවා ගුණාත්මකභාවය I ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ ප්‍රාදේශීය උප කාර්යාල පිහිටුවා මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ යෙදෙන්නන්ට සේවා පහසුකම් පුළුල් කිරීම. II මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ ප්‍රවණතාවයන්ට සරිලන පිරිදි 1993 අංක 50 දරණ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනත සංශෝධනය කිරීම.	• ලග්ගල නව උප කාර්යාලය හා ඇහැළියගොඩ ප්‍රාදේශීය කාර්යාලයේ නව ගොඩනැඟිල්ල ජනතා අයිතියට පවරා ඇත. • පනත් කෙටුම්පත සම්බන්ධයෙන් මැණික් හා ස්වර්ණාභරණ සංගම් වෙතින් හා අධිකාරියේ නිලධාරින්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.
13.	කාර්ය මණ්ඩල අවශ්‍යතා සම්පූර්ණ කිරීම හා හැකියා ධාරිතා සංවර්ධනය.	• කාලීන අවශ්‍යතාවයන්ට සරිලන පරිදි අමාත්‍යාංශයේ, අධිකාරියේ හා පර්යේෂණ ආයතනයේ කාර්ය මණ්ඩල සංශෝධනයන් සිදු කිරීමටත් අවශ්‍ය පුහුණු හා හැකියා වර්ධන අවශ්‍යතා පිළිබඳ හඳුනා ගැනීමටත් කටයුතු කරමින් ඇත.

2.2 2022 වර්ෂය සඳහා වන ඉදිරි දැක්ම

- **ශ්‍රී ලංකාවේ නව මැණික් නිධි ගවේෂණය හා තක්සේරු කිරීමේ ඒකාබද්ධ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**
  මෙම මැණික් නිධි ගවේෂණ ව්‍යාපෘතිය කඩිනම් කිරීම සඳහා මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය සබරගමුව විශ්වවිද්‍යාලය සමඟ ඒකාබද්ධව මැණික් නිධි ගවේෂණය පිළිබඳ ඒකාබද්ධ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පියවර ගැනීම.
- **ශ්‍රී ලංකාව කලාපීය මැණික් මධ්‍යස්ථානයක් බවට පත් කිරීම සඳහා ලංකාවේ හමු නොවන මැණික් වර්ගද සමඟින් මැණික් සංචිතය ඉහළ නැංවීමට කටයුතු කිරීම.**
  මැඩගස්කරය, ටැන්සානියාව,නයිජීරියාව, මොසැම්බික් වැනි විදේශීය රටවල රළු මැණික් මෙරටට ගෙන්වා අගය වැඩි කිරීම සඳහා අවශ්‍ය කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සලසාලීම.
- රත්නපුර ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ වෙළඳ මධ්‍යස්ථානය (Gem Tower) ස්ථාපිත කිරීම.
- **මැණික් තාපකරණය, අගය වැඩි කිරීම හා රසායනාගාර පහසුකම් ආශ්‍රිත පර්යේෂණ සිදු කිරීම**
  සබරගමුව විශ්ව විද්‍යාලයට අනුබද්ධව අන්තර් ජාතික මට්ටමේ වෘත්තීය දැනුම ඇති විශේෂඥවරුන් සහ අවශ්‍ය උපකරණ සහිතව රසායනාගාරයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය සහාය ලබාදීම.
- මාර්ගගත ක්‍රමය ඔස්සේ මැණික් හා ස්වර්ණාභරණ අලෙවිකිරීම් (Online Trading) සඳහා පහසුකම් සැපයීම.

- **මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයට අවශ්‍ය ශිල්පීන්/වෘත්තිකයින් බිහිකිරීම සඳහා පුහුණු පාඨමාලා සංවර්ධනය කිරීම.**
  - මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය මගින් පවත්වනු ලබන පුහුණු පාඨමාලා සඳහා ජාතික වෘත්තීය සුදුසුකම (NVQ) ලබාගැනීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම හා කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ ඇති තාක්ෂණ විද්‍යාල හා කාර්මික විද්‍යාලවල මෙම පුහුණු පාඨමාලා ආරම්භ කිරීම.
  - රත්න විද්‍යාව පිළිබඳ සහතික පත්‍ර හා ඩිප්ලෝමා පාඨමාලා සබරගමුව විශ්ව විද්‍යාලය සමඟ සම්බන්ධ වී ඉදිරියට කරගෙන යාම.
  - කුඩා මැණික් කැපීමේ තාක්ෂණයෙන් (Precision cutting Technology) යුත් ශ්‍රම බලකායක් (Skilled Labour) බිහි කිරීම සඳහා පුහුණු පාඨමාලා ආරම්භ කිරීම.
- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නිරත පුද්ගලික හා රාජ්‍ය ආයතන සමඟ විධිමත් සම්බන්ධීකරණ යාන්ත්‍රනයක් ඇති කිරීම.
- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නිරත කර්මාන්තකරුවන් පිළිබඳව සමීක්ෂණයක් සිදු කිරීම.
- ග්‍රාමීය ආර්ථිකය නගාසිටුවීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වැඩසටහන සඳහා දායකත්වය ලබාදීම.
- මැණික් අපනයනය සඳහා නව වෙළඳපොළවල් හඳුනාගැනීම හා එම වෙළඳපොළවල් සමඟ ගිවිසුම් ගතවීම.
- කර්මාන්තය නියාමනය හා සංවර්ධනය කිරීම සඳහා සුදුසු සංශෝධන සිදු කිරීම.
- අමාත්‍යාංශය සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කිරීම හා එමඟින් අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන වල සේවාවන් හා තොරතුරු කඩිනමින් මහ ජනතාවට ලබා දීමට කටයුතු කිරීම.
- අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනයන්හි අණ පනත් හා ගැසට්, කාලීන අවශ්‍යතාවය පරිදි සංශෝධනය කිරීම.

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

03 පරිච්ඡේදය - 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහන	තත්‍ය 2021 රු.	තත්‍ය නැවත ගලපන ලද 2020 රු.	
	ආදායම් ලැබීම්				
-	ආදායම් බදු	**1**	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**			-	
-	භාණ්ඩාගාර අග්‍රිම		73,030,000	11,890,000	ඒසීඒ-3
-	තැන්පතු		2,591,120	550,846	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		279,780	45,471	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		655,816	82,564	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**76,556,716**	**12,568,881**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**76,556,716**	**12,568,881**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		49,837	97,842	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**76,506,879**	**12,471,039**	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
41,500,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	25,368,752	6,688,451	
79,197,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	21,366,518	5,382,113	ඒසීඒ-2(ii)

91,250,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	77,114,312	77,997,435	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
211,947,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**123,849,582**	**90,067,999**	
	මූලධන වියදම්				
44,200,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	19,475,133	295,091	ඒසිඒ-2(ii)
17,600,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	8,199,456	80,949	
20,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	5,024,000	9,000,000	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
500,000	හැකියා වර්ධනය	14	83,055	-	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
82,300,000	**මුළු මූලධන වියදම් (උ)**		**32,781,644**	**9,376,040**	
	තැන්පතු ගෙවීම්		2,064,588	-	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		1,147,637	768,792	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**3,212,225**	**768,792**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**159,843,451**	**100,212,831**	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**(83,336,572)**	**(87,741,792)**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**83,336,572**	**87,741,792**	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		**0**	**0**	ඒසිඒ-3

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2021 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය	
		2021	**2020**
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	40,840,506	80,949
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	1,591,178	723,321
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**42,431,684**	**804,270**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		513,799	172,475
දේපළ පිරියත හා උපකරණ සංචිතය		40,840,506	80,949
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	1,077,379	550,846
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**42,431,684**	**804,270**

පිටු අංක 07 සිට 38 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 39 සිට 44 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාපිත ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම : ජෙනරාල් දයා රත්නායක
තනතුර :ලේකම්
දිනය : 2022/02/23

ජෙනරාල් දයා රත්නායක
ලේකම්
කර්මාන්ත අමාත්‍යාංශය
73/1, ගාලු පාර, කොළඹ 03.

ගණන්දීමේ නිලධාරි
නම : එස්. එම්.පියතිස්ස
තනතුර : ලේකම්
දිනය : 2022/02/ 22

එස්.එම්.පියතිස්ස
ලේකම්
මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම : එම්.පී.කේ. ජයතුංග
දිනය : 2022/02/ 21

එම්.පී.කේ. ජයතුංග
ප්‍රධාන ගණකාධිකාරී
මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසිඒ-සී

2021 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තක්‍ය	නැවත ගලපන ලද
	2021 රු.	**2020** රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	612,682	74,896
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	73,030,000	11,890,000
අත්තිකාරම් අයකර ගැනීම්	992,352	45,471
තැන්පතු ලැබීම්	2,591,120	550,846

මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**77,226,154**	**12,561,213**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	46,195,270	12,070,564
සහනාධාර සහ මාරුකිරීම්	54,312	24,435
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	-	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	49,837	97,842
අත්තිකාරම් ගෙවීම්	1,147,637	-
තැන්පතු ගෙවීම්	2,064,588	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**49,511,644**	**12,192,841**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**27,714,510**	**368,372**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	43,134	7,668
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**43,134**	**7,668**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	27,757,644	376,040
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**27,757,644**	**376,040**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(27,714,510)**	**(368,372)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**0**	**0**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-

මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(උ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (ඵ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 වාර්තා කිරීමේ පදනම

1) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) <u>ආදායම් හඳුනාගැනීම</u>

4) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

7) <u>මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම.</u>

2021 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2020 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදුකර ඇත.

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
			-අදාළ නොවේ -		

3.7 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය

රු.

ප්‍රතිපාදන වර්ගය	වෙන්කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	211,947,000	211,947,000	123,849,582	58%
ප්‍රාග්ධන	82,300,000	82,300,000	32,781,644	40%
එකතුව	**294,247,000**	**294,247,000**	**156,631,226**	**53%**

3.8 මු.රෙ.**208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණු	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගි කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1						
2			අදාළ නොවේ			
එකතුව						

3.9 මුල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2021 දිනට මුල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදි ගිණුම්කරණය ට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ	40,840,506.35	40,840,506.35		
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරිගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

(ඇමුණුම් **01** හි දක්වා ඇත)

පරිඡේදය 04. කාර්යසාධන දර්ශක

04 පරිච්ඡේදය - ආයතනයේ කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	**75% - 89%**	**50% -74%**
1. මැණික් ගැරීම් බලපත්‍ර ලබාදීම සරල කොට එක් වහළක් යට බලපත්‍ර නිකුත් කිරීමේ සේවාව ක්‍රියාත්මක කිරීම. (One-Stop-Shop)	√		
2. මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ ප්‍රවණතාවයන්ට සරිලන පරිදි, අණ පනත් සංශෝධනය කිරීම.	√		
3. මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තකරුවන් සඳහා අවශ්‍ය බදු සහන ලබාදීමට පහසුකම් සැලසීම.	√		

පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

05 පරිච්ඡේදය - 5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශකය	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
			0% - 49%	50% 74%	75% - 100%
04.පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම.	4.4 2030 වන විට සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් ඇතුළුව අදාල කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැළකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම.	4.4.1 කුසලතාවය ආකාරය අනුව මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ කුසලතාවයෙන් යුක්ත පුහුණුලාභීන්ගේ ප්‍රමාණය		√	
09. සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ හා තිරසාර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරි ගැන්වීම.	9.2 ඇතුළත් සහ තිරසාර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම සහ 2030 වන විට අවම වශයෙන් කර්මාන්ත ක්ෂේත්‍රයේ රැකියා ප්‍රමාණය සහ දළ දේශීය නිෂ්පාදිතයන් 50% කින් වැඩි කිරීම.	9.2.1 මැණික් හා ස්වර්ණාභරණ අපනයන නිෂ්පාදන වටිනාකම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස			√
	9.5 විද්‍යාත්මක පර්යේෂණ වැඩිදියුණු කිරීම.	9.5.1 දළ දේශීය නිෂ්පාදනයේ අනුපාතයක් ලෙස පර්යේෂණ හා සංවර්ධන පිරිවැය		√	

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

06 පරිච්ඡේදය - 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු**(අතිරික්ත) /
ජ්‍යෙෂ්ඨ	10	04	07
තෘතීයික	02	01	01
ද්විතියික	15	04	11
ප්‍රාථමික	13	02	11
එකතුව	**40**	**11**	**30**

**කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය.

මෙම අමාත්‍යාංශයේ අනුමත කාර්යමණ්ඩල හිඟයක් පවතින අතර දැනට සිටින කාර්යමණ්ඩලය 11 කි. එම තත්ත්වය ආයතනයේ කටයුතු කාර්යක්ෂමව කරගෙන යාමට අහිතකර ලෙස බලපා ඇත.

6.2 මානව සම්පත් සංවර්ධනය

වැඩ සටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
රාජ්‍ය නිලධරයෙකුගේ සාමාන්‍ය හැසිරීම හා විනය	14	2021/03/16	1,500.00	-	දේශීය	රාජ්‍ය නිලධරයෙකුගේ සාමාන්‍ය හැසිරීම හා විනය පිළිබඳ දැනුම
රාජ්‍ය නිලධරයෙකුගේ සාමාන්‍ය හැසිරීම හා විනය	13	2021/03/23	1,955.00	-	දේශීය	රාජ්‍ය නිලධරයෙකුගේ සාමාන්‍ය හැසිරීම හා විනය පිළිබඳ දැනුම
කාර්යාල ක්‍රමවේද	19	2021/04/06	1,000.00	-	දේශීය	ලිඛිත සන්නිවේදන ක්‍රම පිළිබඳ දැනුම
පෞද්ගලික ලිපිගොණු පුහුණුව	04	2021/11/23	20,000.00	-	දේශීය	පෞද්ගලික ලිපිගොණුවක් ඵලදායී ආකාරයෙන් පවත්වාගෙන යාම
නිවාඩුභාර නිලධාරියාගේ කාර්යභාරය හා වගකීම	02	2021/12/07	8,000.00	-	දේශීය	නිවාඩුභාර නිලධාරියාගේ කාර්යභාරය හා වගකීම පිළිබඳව අවබෝධය
ප්‍රසම්පාදන ක්‍රියාවලිය	05	2021/12/08	25,000.00	-	දේශීය	රාජ්‍ය / පළාත් සභා ආයතනවල ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ කරනු ලබන වැඩ, සේවා, සැපයුම් බදු, විකුණුම් හා උපදේශන සේවා

						කාර්යයන් විධමත්ව, ඵලදායීව හා වගවීමෙන් ඉටු කිරීම පිළිබඳ දැනුම
Advanced MS Excel Skills	05	2021/12/20 2021/12/27	10,500.00	-	දේශීය	Advanced MS Excel Skills
ගිණුම්කරණ කාර්යභාරය හා ප්‍රායෝගික භාවිතය	02	2021/12/21 2021/12/27	10,000.00	-	දේශීය	ගිණුම්කරණ කාර්යභාරය හා ප්‍රායෝගික භාවිතය
කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි	02	2021/12/29 2021/12/30	16,000.00	-	දේශීය	කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි පිළිබඳ දැනුම

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මුල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මුල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	මෙම අත්තිකාරම් ගිණුම් මෙම අමාත්‍යාංශයට අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්			
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්			
1.6	වෙනත්			
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ් පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		

2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	.	
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA -N 20)යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
3	**මුල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මුල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මුල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිනඩි මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	මෙම අමාත්‍යාංශය 2020.09.04 දින ආරම්භ වූ අතර අභ්‍යන්තර විගණක හා විගණන අංශය පිහිටුවනු ලැබුයේ 2021 වර්ෂය අගභාගයේ දීය.	
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශ නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය මු.රෙ.134(2)**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමණාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන කළමණාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා ගෙන තිබීම	අනුකූල නොවේ	පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් 2021 මුදල් වර්ෂයට අදාලව විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් 2ක් පමණක් පවත්වන ලදී.	
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	නව අමාත්‍යාංශයක් බැවින් ප්‍රමානවත් නිලධාරීන් නොමැති හේතුවෙන් ඉටු කිරීමට නොහැකි වී ඇත.	2022 වර්ෂයේ සිට මෙම වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර තිබීම	අනුකූල නොවේ		

8.3	රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණය පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍ර ලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ	.	
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය මු.රෙ.722 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ	සංචිතය සඳහා එක් වාහනයක් පමණක් ඇති අතර එය 2020.12.07 දින මෙම අමාත්‍යාංශයට මෙම වාහනය පවරා ඇත.	
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අදාල නොවේ	-	-
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ	එක් වාහනයක අනතුරු වාර්තා වී ඇති අතර ඒ පිළිබඳව කටයුතු කරමින් පවතී	
9.5	2016.12.29 දිනැති 30/2016 අංක දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඡේදයේ සඳහන් විධි 3.1 වාහන වල ඉන්ධන දහනය වීම, විධාන ප්‍රකාරව නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ	කටයුතු සිදුවෙමින් පවතී.	
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ	බදු වාහන නොමැත	
10	**බැංකු සැසඳුම් විස්තර**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		

10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		-
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයොජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචන වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		

15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	මෙම ආදායම් ගිණුම් මෙම අමාත්‍යාංශයට අදාළ නොවේ		
15.2	රැස් කොට තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම			
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම			
16	**මානව සම්පත් කළමණාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල නොවේ	කාර්යමණ්ඩල තනතුරු පුරප්පාඩු පිළිබඳව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත මාසිකව දැනුම්දෙනු ලබයි. ප්‍රාථමික ශ්‍රේණි වල පුරප්පාඩු පිළිබඳව බහුකාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් මාර්ගගත ක්‍රමයට වරින් වර ඉල්ලීම් කරනු ලබයි.	
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයා චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල නොවේ		වෙබ් අඩවිය සකස් කිරීමට අදාල කටයුතු සිදු කරමින් පවතී.

17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 10 වන හා 08 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත්කිරීම.	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක (1)2018/05 හා 2008/05දරණ රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි සේවාලාභී ප්‍රඥප්තියක්/ සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල නොවේ		සකස් කරමින් පවතී
18.2	එම චක්‍රලේඛයේ ඡේදය පරිදි 2.3 සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදන/පුරවැසිකිරීම හා ක්‍රියාත්මකකිරීම ේ කටයුතු අධීක්ෂණයකිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් .කොට තිබීම.	අනුකූල නොවේ		කටයුතු කරමින් පවතී
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2018.01.24 ආකෘතිය පදනම් 02 ඇමුණුම 2018/02 අංක කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කොට තිබීම.	අනුකූල නොවේ		මානව සම්පත් සැලැස්ම සකස් කරමින් පවතී. මූලික කටයුතු ආරම්භ කර ඇත.
19.2	කාර්යමණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවූ රු කොට තිබීම.	අනුකූල නොවේ		මානව සම්පත් සැලැස්ම සකස් කරමින් පවතී. මූලික කටයුතු ආරම්භ කර ඇත.
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම හි 01 දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල නොවේ		මානව සම්පත් සැලැස්ම සකස් කරමින් පවතී. මූලික කටයුතු ආරම්භ කර ඇත.
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධන කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම.**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්නා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } අයිඩබ්ලිව්ආර්/සී/එස්එම්ජීජේආර්අයි/එස්එල්/01/2021

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2022 මැයි 31 දින

මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය
05 JUN 2022
වේලාව 4.05 PM.
ලද්දාමි නිලධාරියා
561/3, පැල්පිටියල පාමිංග, හෝමාගම 05.

ලේකම්,

මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

ඩී.වී.චන්ද්‍රලතා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් : 01. ලේකම් - කර්මාන්ත අමාත්‍යාංශය
02. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. අයිඩබ්ලිව්ආර්/සී/එස්පමජේඅාර්අයි/
එස්එන්/01/2021

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2022 මැයි 31 දින

ගණන්දීමේ නිලධාරී,
මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය.

මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 31 දින නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව් සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.1.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) ඉකුත් වර්ෂය අවසානයට දේපල, පිරියත හා උපකරණවල වටිනාකම රු.80,949 ක් වූ අතර එම වටිනාකම මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කළ SA 82 මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස දැක්වීමේදී රු.61,729 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.19,220 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ii) දේපල පිරියත හා උපකරණවල ආරම්භක ශේෂයට කාර්යාල උපකරණ, පරිගණක උපකරණ හා සන්නිවේදන උපකරණ සඳහා රු.1,719,689 ක් එකතු කර තිබූ අතර එහි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා එම වටිනාකම සෑදී ඇති අයිතමයන් හා වටිනාකම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
(අ) ස්ථාවර වත්කම් ලේඛනය	2021 ජූලි 26 දිනැති රාජ්‍ය ගිණුම් SA/GFS/01/01/08 – VOLUME ii දරන ලිපිය අනුව මූල්‍ය නොවන වත්කම්හී ගිණුම්මය නිවැරදිතාවය පවත්වා ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් විධිමත් ලෙස පොත්පත් පවත්වාගෙන යා යුතුය.	ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ආ) හානි හා පාඩු පිළිබඳ ලේඛනය	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 110 ප්‍රකාරව හානි පිලිබඳ ලේඛනය පවත්වාගෙන යා යුතුය.	හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

(අ) වැඩසටහන් 1 හා වැඩසටහන් 2 යටතේ පුනරාවර්තන වියදම් සඳහා අයවැය ඇස්තමේන්තුගත ශුද්ධ ප්‍රතිපාදනය රු.206,947,000 ක් වූ අතර ඉන් උපයෝජනය කර තිබුණේ රු.123,849,582 ක් පමණකි. මේ අනුව රු.83,097,418 ක පුනරාවර්තන වියදම් සඳහා වූ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 40 ක් විය.

(ආ) පුනරාවර්තන වැය විෂයයන් 15 ක සංශෝධිත ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 50 ක සිට සියයට 100 ක දක්වා පරාසයක ඉතිරි කිරීම් කර තිබුණි.

(ඇ) වැඩසටහන් 1 හා 2 යටතේ ප්‍රාග්ධන වියදම් සඳහා අයවැය ඇස්තමේන්තුගත ශුද්ධ ප්‍රතිපාදනය රු.87,300,000 ක් වූ අතර තථ්‍ය වියදම රු.32,781,644 ක් විය. මේ අනුව රු.54,518,356 ක්වූ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණු අතර එය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 62 ක් බව නිරීක්ෂණය විය.

(ඉ) මූලධන වැය විෂයයන් 4 ක සංශෝධිත ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 61 සිට සියයට 100 ක්ව පරාසයක ඉතිරිකිරීම් කර තිබුණි.

(ඊ) අංක 440-1-00-1409 දරන "වෙනත්" වැය විෂයන් අංක 440-1-1-0-2003 දරන මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් - වාහන වැය විෂයට මු.රෙ.66 යටතේ රු.5,000,000 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය තුල මාරුකර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම වැය විෂයයේ රු.4,728,542 ක් ඉතිරිව පැවතුණි.

2.2 පාඩු හා හානි

මු.රෙ.104(4) ප්‍රකාරව අලාභ හානි සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත දී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුල සිදුවූ වාහන අනතුරු 3 ක් සම්බන්ධයෙන් 2022 මැයි 25 දින වන විටත් එසේ කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) අමාත්‍යාංශය යටතේ පවතින ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පිහිටුවීමේ පනත සංශෝධනය කිරීම සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු බවට නීති කෙටුම්පත් සම්පාදක විසින් 2020 වර්ෂයේ දැනුම් දී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ආ) රත්‍රන් ආනයනය කිරීමේදී ආනයන පාලන බලපත්‍රයක් ලබාගත යුතු බවත් ඒ සඳහා CIF වටිනාකම මත සියයට 0.4 ක ආනයන පාලන බලපත්‍ර ගාස්තුවක් ගෙවීමටත් නියම කර තිබුණි. මේ නිසා ස්වර්ණාභරණ ව්‍යාපාරිකයන්ට සිදුවන අපහසුතා පිළිබඳව එම ව්‍යාපාරිකයන්ගේ දැනුම් දීම මත අමාත්‍යාංශය මගින් එකී බලපත්‍ර ගාස්තුව අහෝසි කිරීමට මුදල් අමාත්‍යාංශය වෙත යෝජනා කර තිබුණි. එමෙන්ම විදේශ රටවලින් ආනයනය කරන රත්‍රන් ප්‍රමාණයට සාපේක්ෂව ආභරණ අපනයනය වීමත් සිදුවී නොමැති බවත් එමගින් රට තුලට විදේශ විනිමය වැඩිවීමක් සිදුවී නොමැති බවට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් වාර්තා කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය මහජනතාව වෙත සේවා සැපයීමේදී හා මැණික් ගැරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී ඇතිවන ගැටලු හා පරිසර විනාශයන් සම්බන්ධව මහජන පැමිණිලි 120 ක් ලැබී තිබුණි. එම මහජන පැමිණිලි පරීක්ෂා කර බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස අධිකාරිය වෙත යොමුකර තිබුණත් ඉන් පැමිණිලි 10 කට පමණක් අමාත්‍යාංශය වෙත පිළිතුරු ලබාදී තිබු අතර මේ සම්බන්ධව සොයා බලා අවශ්‍ය කටයුතු කිරීමට සහ ඒ පිළිබඳව වැඩිදුර විමර්ශනයක් කිරීමට අමාත්‍යාංශය පියවර ගෙන නොතිබුණි.

(ඈ) මැණික් හා ස්වර්ණභරණ අධිකාරිය සඳහා ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා සමුපකාර අමාත්‍යාංශයට අයත් ඉඩමක් එම අමාත්‍යාංශයෙන් ලිඛිතව විමසීමකින් තොරව පවරාගැනීම සඳහා 2020 දෙසැම්බර් 31 වන දින අ.මි.ප. 2208/32 දරන අති විශේෂ ගැසට් නිවේදනයක් නිකුත් කර තිබුණි. එහෙත් එම ඉඩම 2021 අගෝස්තු 2 වන දින සමුපකාර වෙළඳ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබීම හේතුවෙන් අමාත්‍යාංශයේ අරමුණ ඉටු කර ගැනීම සඳහා මෙම ඉඩම පවරා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඉ) මැණික් වැනි දැනට හඳුනා ගෙන ඇති වටිනාකම එකතු කිරීමකින් තොරව අපනයනය කරන බනිජ සම්පත් එසේ අපනයනය කිරීම සීමා කොට වටිනාකම එකතු කල ඉහල අපනයන ආදායමක් ලබා ගත හැකි නිෂ්පාදන බවට පත්කර අපනයනය කිරීම සම්බන්ධව අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 2 හි පහත දැක්වෙන අඩුපාඩු තවදුරටත් පවතින බව නිරීක්ෂණය විය.

(i) දැනට ශ්‍රී ලංකාව තුල හමුවන මැණික් බොහෝ දුරට අගය එකතු කිරිමකින් තොරව කපා ඔපමට්ටම් කර හෝ රළු මැණික් ලෙස විදේශවලට අපනයනය කරමින් පවතින අතර 2015-2021 සැප්තැම්බර් දක්වා කාලය තුල අගය එකතු කිරිමකින් තොරව ඵලෙස අපනයනය කල මැණික්වල වටිනාකම රු.මී. 127,635 ක් විය.

(ii) අඩු වටිනාකමකින් යුතු මැණික් ගල්වල වර්ණය හා පැහැදිලි බව වැඩි කිරිම සඳහා පහුගිය කාලය තුල නිසි වැඩපිළිවෙලක් නොවිමෙන් ලංකාව තුල හමුවන අඩු වටිනාකමින් යුතු මැණික් ගල් පසුගිය කාලය තුල අඩු වටිනාකමක් සහිතව අපනයනය වී ඇති බව මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ තොරතුරු අනුව නිරික්ෂණය විය. මේ සඳහා ජාතික විද්‍යා පදනමේ මූල්‍යාධාර මත මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය විසින් පර්යේෂණයක් සිදුකර එහි වාර්තාව 2021 මැයි මස ලබා දි තිබුණි. එහෙත් ඒ පිළිබඳව අවධානය යොමුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(iii) අගය එකතු කිරිමකින් තොරව සිදුකරන ගෙවුඩ අපනයනය නවත්වා ඇති බවට අමාත්‍යාංශයේ සෞභාග්‍යයයේ දැක්ම පිළිබඳ ප්‍රගතිය වාර්තාවේ දක්වා ඇති නමුත්, 2015 - 2021 සැප්තැම්බර් කාලය තුල ගෙවුඩ අපනයනය කිරීම මගින් රු.මී. 306 ක ආදායම් උපයා තිබුණි.

(iv) ගෙවුඩ පිළිස්සීම සඳහා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය 2013 වර්ෂයේ රු.10,977,344 ක වටිනාකමට මිලදීගත් උදුනක් වර්ෂ 6 ක කාලක් නිෂ්කාර්යව පැවතුණි. 2020 -2021 කාලය තුල් රු.3,953,540 ක මුදලක් දරා මෙම උදුනට අමතර කොටස් සහ විදුලි පරිපථ යොදා වැඩිදියුණු කිරීම් කර තිබු අතර 2020 - 21 කාලය තුල දින 14 ක කාලයක් පමණක් පර්යේෂණ ධාවන වාර 5 කට යන්ත්‍රය භාවිතා කර තිබුණි.

(ඊ) භූගතව ඇතැයි සැලකෙන මැණික් සම්පත් නූතන අධි තාක්ෂණය භාවිතයෙන් ගවේෂණය කර රටේ නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරිමට යොදා ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය යටතේ පවතින මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය විසින් ශ්‍රී ලංකාවේ මැණික් නිධි ගවේෂණය කිරිම හා තක්සේරු කිරිම සම්බන්ධව සිදුකරන ව්‍යාපෘති මගින් ලංකාවේ මැණික් නිධි පිහිටි ප්‍රදේශ හඳුනාගෙන සිතියම් ගත කිරීම හා අවසාන වාර්තා නිකුත් කරමින් පැවතුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදි මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය හා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස

ආයතනය අතර නිසි සම්බන්ධීකරණයක් නොමැතිව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම නිසා ව්‍යාපෘතියෙන් ලැබෙන ප්‍රතිඵල අඩු තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය.

3.2 වත්කම් කළමනාකරණය

(අ) ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයට අයත් ගොඩනැගිල්ලක අමාත්‍යාංශය පවත්වා ගෙන ගොස් තිබූ අතර සමාලෝචිත වර්ෂය තුල එම ගොඩනැගිල්ලේ පිහිටි විෂය භාර රාජ්‍ය අමාත්‍යවරයාගේ කාර්යාලය නවීකරණය කිරීම සඳහා කොන්ත්‍රාත් සමාගමක් වෙත රු.10,432,877 ක මුදලක් ද උපදේශන ගාස්තු ලෙස මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය වෙත රු.1,674,594 ක්ද ගෙවා තිබුණි.

(ආ) වෙනත් ආයතන සතු වාහන 5 ක් විධිමත්ව පවරා ගැනීමකින් තොරව අමාත්‍යාංශය භාවිතා කරන බව නිරීක්ෂණය විය.

ඩී.වී.චන්ද්‍රලතා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට